කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024
2026 ජූලි / අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

# ප්‍රතිබිම්බ කලාව

## ප්‍රතිබිම්බ කලාවේ පරිණාමය IMAT 18224

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

1. ඡායාරූප ශිල්පය බිහිවීම සඳහා මූලික වූ තාක්ෂණික පසුබිම විස්තර කරමින්, 'කැමරා ඔබ්ස්කියුරාව (Camera Obscura) සහ පින්හෝල් කැමරාව (Pinhole Camera) මගින් ප්‍රතිබිම්බයක් නිර්මාණය වන ආකාරය රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

2. ඡායාරූප ශිල්පය විද්‍යාත්මක සොයාගැනීමක සිට ප්‍රායෝගික මාධ්‍යයක් ලෙස සංවර්ධනය කිරීම උදෙසා ලුවී ජැක් මැන්ඩේ ඩැගියුරේ (Louis Daguerre) සහ හෙන්රි ෆොක්ස් ටැල්බොට් (Henry Fox Talbot) යන ශිල්පීන් ඉටුකළ මෙහෙවර සංසන්දනාත්මකව පැහැදිලි කරන්න.

3. ඡායාරූප ශිල්පය සාමාන්‍ය ජනතාව අතර ප්‍රචලිත කිරීම පිණිස ජෝර්ජ් ඊස්ට්මන් (George Eastman) විසින් භාවිත කළ උපාය උපක්‍රම ඡායාරූප ඉතිහාසය ඇසුරෙන් විස්තර කරන්න.

4. චලන චිත්‍රය බිහිවීමට පදනම වූ "දෘෂ්ටියේ අඛණ්ඩතාව" (Persistence of Vision) යන සංකල්පය හඳුන්වා දී, සිනමාව බිහිවීමට පෙර චලනය මවන ලද චලන චිත්‍ර ක්‍රීඩා භාණ්ඩ (Motion Toys) දෙකක් පිළිබඳව විස්තර කරන්න.

5. සිනමාව හුදු තාක්ෂණික සොයාගැනීමක සිට කතාන්දරකීමේ (Storytelling) කලාවක් දක්වා සංවර්ධනය කිරීමේදී ජෝර්ජ් මෙලීස් (Georges Méliès) ගේ දායකත්වය සිනමා ඉතිහාසය ඇසුරින් විග්‍රහ කරන්න.

6. සිනමා කලාවේ පුරෝගාමියෙකු ලෙස ඩී.ඩබ්ලිව්. ග්‍රිෆිත් (D.W. Griffith) සතු සුවිශේෂීත්වය පෙන්වා දෙමින්, සෝවියට් සිනමාකරුවන් හඳුන්වා දුන් 'මොන්ටාජ්' (Montage) රීතිය සිනමාව කලාවක් ලෙස ස්ථාපිත කිරීමට බලපෑ ආකාරය සාකච්ඡා කරන්න.

7. ශ්‍රී ලංකාවේ රූපවාහිනී මාධ්‍යයේ ආරම්භය සහ එහි මුල්කාලීන ව්‍යුහය දේශීය ප්‍රේක්ෂකාගාරය කෙරෙහි බලපෑ ආකාරය පැහැදිලි කරන්න.

8. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) ක් තෝරා කෙටි සටහන් ලියන්න.
   - I. ලූමියේ සහෝදරවරු (Lumière brothers)
   - II. එඩ්වඩ් මයබ්‍රිජ් (Eadweard Muybridge)
   - III. ජෝසප් නිසෆෝර් නීප්සේ (Nicéphore Niépce)
   - IV. ස්වාධීන රූපවාහිනී සේවය (ITN)

************************